7 වසර

## නර්තන සම්ප්‍රදායන් හා සබැඳි චාරධර්ම.

අතීතයේ දී නර්තන අධ්‍යාපනයේ තක්සලාව ගුරුගෙදර වූ අතර, එහිදී ශිල්ප හොඳින් හදාරන ශිෂ්‍යයා (ආධුනිකයා) ගුරුවරයාගේ අනුදැනුම ඇතිව, ජන්ම පත්‍රය බලා සුදුසු හෝරාවකට අනුව දෙමාපිය අවසරයෙන් කලඑළි බැසීමට සුදුසුකම් ලබයි. උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදාය තුන තුළ එන චාරිත්‍ර සුළු වශයෙන් වෙනස්කම් පවතින අතර, කලඑළි අවස්ථා මෙසේ නාමිකව හඳුන්වා දෙනු ලැබේ.

- උඩරට සම්ප්‍රදාය - හිස වෙස් බැඳීමේ මංගල්‍යයයි.
  (ශීර්ෂාභරණ පැළඳවීමේ මංගල්‍යය.
- පහතරට සම්ප්‍රදාය - මඩු බැසීමේ මංගල්‍යයයි.
- සබරගමු සම්ප්‍රදාය - ගුරු වරම් දීමේ මංගල්‍යයය.

## උඩරට නර්තන සම්ප්‍රදායේ හිස වෙස් පැළඳවීමේ මංගල්‍යය.

ගුරු ගෙදර අධ්‍යාපනය නිම කරන ආධුනිකයා තම ජන්ම පත්‍රයට අනුව නියම කරගත් දිනට තෙමසක් කලින් කිලිවලින් ආරක්ෂා වී උදේ සවස ස්නානය කර, පිරිසිදු වී ආගමික වතාවත්වල යෙදීම සිරිතකි. එම වකවානුව තුළ ගුරුවරයා ආධුනිකයා වෙත ශිල්පය ලබාදීම සිදුකෙරේ. හැඳෑන් දිනට ආසන්න දින 07 ක් ආධුනිකයා විහාරස්ථානයේ ආගමික වතාවත්වල යෙදී සවස අදාළ දෙවි දේවතාවන්ට පහන් පැලක් සකසා පහන් දල්වා ආශිර්වාද ලබාගනී. හැඳෑන් දිනට පූර්ව දින රාත්‍රී සකල ඇතුළු රංගවස්ත්‍රාභරණ පේකර, බෝධි පූජාවට සහභාගි වේ.

හැඳෑන් දින උදෑසන ගුරුවරයා අතින් පැන් දොවාගත් ආධු-නිකයා විහාර ගෙට ගොස් හිසවෙස් පැළඳවීම සෙත් පිරිත් ගායනය මැද සිදුකෙරේ. මුහුණ සුදු රෙදිකඩෙන් ආවරණය කරගෙන විහාරයෙයින් පිටතට පැමිණ අදාළ චාරිත්‍ර සිදුකර බෝ රුක හෝ මල් බුලත් කවටුව හෝ දෙස බලා වහන්තරාව ඉවත් කොට, පළතුරු පූජාවක් පිළිගන්වා ගුරු හා නැමැදි "මංගලම්" නර්තනයෙන් රංගනය ආරම්භ කර, ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි. එහිදී ~~කළණ තෝරා~~ ශිෂ්‍යයාට නැගිබෝග පිරිනැමීම චාරිත්‍රයකි.

## පැවරුම.

* ඉහත සඳහන් කර ඇති සටහන ඔබේ නර්තන පොතෙහි සටහන් කරගන්න.
* හිස වෙස් පැළඳවීමේ මංගල්‍යයට අදාළ චාරිත්‍ර විධි ඇතුළත් පින්තූර එකතු කර අනුපිළිවෙලට අනුව චිත්‍ර පෙරළියක් සකස් කරන්න.
* ඔබ ඉගෙන ගන්නා සම්ප්‍රදාය හැර, වෙනත් සම්ප්‍රදායකට අයත් කලඑළි බැසීමේ මංගල්‍යයක් පිළිබඳ තොරතුරු රැස් කරන්න.